# කර්මාන්ත අමාත්‍යාංශය

# සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම

## ඇබෑර්තු

සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම යනු පූර්ණ වශයෙන් රජය සතු ලාභ උපදවන හා ස්වයං පෝෂිත, ශ්‍රී ලංකාවේ, රසායන ද්‍රව්‍ය නිෂ්පාදනයේ හා අලෙවි ක්ෂේත්‍රයේ යෙදෙන ආයතනයකි. ආයතනයේ පවත්නා පහත සඳහන් තනතුරු පිරවීම සඳහා සුදුසුකම්ලත් අයවලුන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි) තනතුර - (MM 1-1) තනතුර 01

**තනතුරට අදාළ වගකීම් :**

i) ව්‍යාපාර සැලසුම් නිර්මාණය, ව්‍යාපාර උපායමාර්ග ශිල්පීකරණය, උපායමාර්ග ක්‍රියාත්මක කිරීම හා ප්‍රතිපල අධීක්ෂණය.

ii) වෙළඳ/ අලෙවි කණ්ඩායම කළමනාකරණය/ සැලසුම් ප්‍රගතිය අධීක්ෂණය සහ කණ්ඩායමට පුහුණුව ලබාදීම සඳහා හැකියාව.

iii) වෙළඳපොල සමීක්ෂණ පැවැත්වීම හා වාර්තා සකස් කිරීම සඳහා හැකියාව.

iv) අලෙවිකරණ ඉදිරිපත් කිරීම් සම්බන්ධ ඉහළ කුසලතා

v) කර්මාන්ත හා පාරිභෝගික වෙළඳපොළ තුළ අලෙවි හා ව්‍යාපාරික අවස්ථා හඳුනාගැනීමේ හැකියාව.

vi) අලෙවිකරණ වැඩසටහන් පැවැත්වීම හා වැඩසටහන්වල ප්‍රගතිය ඇගයුම් කටයුතු.

vii) සමාගමේ ඉලක්ක ඉටු කර ගැනීමේ හැකියාව

Viii) නව නිෂ්පාදන සංවර්ධන උපායමාර්ග පිළිබඳ කුසලතා

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් අලෙවිකරණ/ අලෙවි කළමනාකරණ/ ව්‍යාපාර පරිපාලන (MKT)/ ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්,

   සහ

   තනතුරට අදළ ක්ෂේත්‍රයේ, ප්‍රථම උපාධිය ලබාගත් පසුව, අවම වශයෙන් වසර එකක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

2. තනතුරට හා විෂය ක්ෂේත්‍රයට අදළව පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අන්තර්මධ්‍ය විභාගය සමත්වීම

   සහ

   ප්‍රථම උපාධිය ලබාගත් පසුව, තනතුරට අදළ ක්ෂේත්‍රයේ, අවම වශයෙන් වසර එකක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදළ විෂය ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරු (JM) වර්ගීකරණයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

**වයස් සීමාව :**

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම ඉහල වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්හට අදළ නොවේ.)

**වැටුප් පරිමාණය :** MM 1-1

රුපියල් 53,175–10x1,375–15X1,910 – 95,575 (වසරකට)

**මූලික වැටුප** : රුපියල් 53,175/– හා ජීවන වියදම් අංක දීමනාව රුපියල් 7,800/– හා අයවැය දීමනාව – රුපියල් 5,000.00 (මසකට)

**ප්‍රවාහන දීමනාව** : රුපියල් 15,000/– (මසකට)

## සැපයුම් නිලධාරී තනතුර (JM 1-1) - තනතුර 01

**තනතුරේ වගකීම්**

i) දේශීය/ ජාත්‍යන්තර රසායන ද්‍රව්‍ය හා අමුද්‍රව්‍ය නිෂ්පාදකයන් හා සැපයුම්කරුවන් හඳුනාගැනීමේ හැකියාව.

ii) ආනයන/ අපනයන ක්‍රියාපටිපාටීන් සම්බන්ධව පළපුරුද්ද

iii) නාවික සමාගම් හා භාණ්ඩ ප්‍රවාහන නියෝජිතයන් සමග සම්බන්ධීකරණය හා ගාස්තු ආදිය පිළිබඳව සාකච්ඡා කිරීමේ හැකියාව.

iv) සමාගමේ කාර්යඵල ඇගයුම් පත්‍ර (KPI) ඉටු කර ගැනීම අනිවාර්ය වේ.

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රවාහන හා සේවා සැපයුම් කළමනාකරණ/ කළමනාකරණ/ ව්‍යාපාර පරිපාලන/ ව්‍යාපාර කළමනාකරණ/ සැපයුම්දාම කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදළ විෂය ක්ෂේත්‍රයේ "කළමනාකරණ සහකාර – තාක්ෂණ නොවන (MA 1-2) II ශ්‍රේණිය තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

**වයස් සීමාව :**

අවුරුදු 22 කට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදළ නොවේ)

**වැටුප් පරිමාණය (JM 1-1)**

JM 1-1-2016 : රුපියල් (42,600 - 10x755 - 18x1,135 - 70,580/-)

**මූලික වැටුප** : රුපියල් 42,600/–, ජීවන වියදම් අංක දීමනාව රුපියල් 7,800/– හා අයවැය දීමනාව රුපියල් 5,000/–

## ඉහත තනතුරු දෙක සඳහා බඳවා ගැනීමේ ක්‍රමවේදය :

ලිඛිත තරගකාරී විභාගයක් සහ/ හෝ පත්කිරීමේ බලඅධිකාරිය විසින් පත්කරන ලද පරීක්ෂණ සභාවක් විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**සෑම අයදුම්කරුවකුම**

i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ii) තනතුරුවලට අදළව රාජකාරී මනා ලෙස ඉටුකිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් හැකිවනසේ මනා කායික හා මානසික සුවතාවයෙන් යුක්ත විය යුතුය.

iii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**වෙනත් ප්‍රතිලාභ**

මාසික පැමිණීමේ දිරිදීමනාව හා වාර්ෂික ප්‍රසාද දීමනා ද ගෙවනු ලැබේ. අදළ සෞඛ්‍ය රක්ෂණ ආවරනය සමාගම විසින් දරනු ඇත.

සේවක අර්ථසාධක අරමුදල (EPF) හා සේවක භාර අමුදල (ETF) සඳහා සමාගම විසින් පිළිවෙළින් 15% හා 3% දයකත්වය ලබා දෙනු ලබන අතර, සේවකයා විසින්, තම වැටුපෙන් 10% ප්‍රමාණයක් සේවක අර්ථසාධක අරමුදල වෙත ලබාදිය යුතුය.

**අයදුම් කිරීමේ ක්‍රමවේදය**

සම්පූර්ණ ජීවදත්ත, ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග අධ්‍යාපනික හා පළපුරුද්ද සම්බන්ධ සහතික වල පිටපත් සහිතව සකස් කළ අයදුම්පත්, ලියාපදිංචි තැපෑලෙන්, පහත සඳහන් ලිපිනය වෙත, **2023-01-13** දිනට පෙර ලැබීමට සැලැස්වි යුතුය. අදළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

දෙපාර්තමේන්තු/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය සංස්ථා/ පූර්ණ ලෙස රජය සතු සමාගම්වල අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුවේ. අසම්පූර්ණ හෝ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. කෙටි ලැයිස්තුගත කළ සුදුසුකම්ලත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

**සභාපති,**
**සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම,**
**අංක 446, ගාලු පාර, රත්මලාන.**
0112-324466/0112-437556
www.pccl.gov.lk

**Source: Dinamina, Daily News (2022.12.26)**